සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2016 ජූලි

## (AA22) පිරිවැය ගිණුම්කරණය හා වාර්තාකරණය

(Cost Accounting and Reporting)

2016-07-17
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරික්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්යය ප්‍රශ්න අට (08) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.5 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 පිරිවැය, ස්ථාවර සහ විචල්‍ය ලෙස වර්ගීකරණය කරන්නේ:

(1) පිරිවැයේ හැසිරීම (behavior) මතයි.
(2) පිරිවැයේ ස්වභාවය (nature) මතයි.
(3) පිරිවැයේ කාර්යය (function) මතයි.
(4) පිරිවැයේ අරමුණ (purpose) මතයි.

(ලකුණු 02)

1.2 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) පිරිවැය ගිණුම්කරණයේ අරමුණක් වන්නේ ලාභය උපරිම කිරීමයි.
(2) පොදුකාර්ය පිරිවැය යනු ප්‍රාථමික පිරිවැයේ මූලිකාංගයකි.
(3) පිරිවැය ගිණුම්කරණය වඩාත් සැලකිලිමත් වන්නේ පිරිවැය නිශ්චය කිරීම සහ පාලනය කිරීම පිළිබඳවයි.
(4) ඉහත සඳහන් සියල්ලම වේ.

(ලකුණු 02)

1.3 පහත සඳහන් ඒවා අතුරෙන් නිෂ්පාදන පිරිවැයෙහි කොටසක් ලෙස සලකනු **නොලබන්නේ** කුමක් ද?

(1) කර්මාන්තශාලාවේ භාවිත කරන යන්ත්‍ර වල ක්ෂය.

(2) යන්ත්‍ර ක්‍රියාකරුවන්ගේ වේතන.

(3) කර්මාන්තශාලා පරිශ්‍රයේ කුලිය.

(4) කාර්යාලයීය සේවක මණ්ඩලයේ වැටුප්. (ලකුණු 02)

1.4 පහත සඳහන් තොරතුරු නිෂ්පාදන සමාගමක පොත්වලින් 2015 වර්ෂය සඳහා උපුටා ගන්නා ලදි:

| | | |
|---|---|---|
| සත්‍ය පොදුකාර්ය | : | රු.100,000/- |
| අයවැයගත පොදුකාර්ය | : | රු.120,000/- |
| සත්‍ය යන්ත්‍ර පැය | : | පැය 18,000 |
| අයවැයගත යන්ත්‍ර පැය | : | පැය 20,000 |

ඉහත සඳහන් තොරතුරු මත, පොදුකාර්ය පිරිවැය:

(1) රු.8,000/- කින් අධි අන්තර්ග්‍රහණය වී ඇත. (2) රු.8,000/- කින් ඌන අන්තර්ග්‍රහණය වී ඇත.

(3) රු.30,000/- කින් අධි අන්තර්ග්‍රහණය වී ඇත. (4) රු.30,000/- කින් ඌන අන්තර්ග්‍රහණය වී ඇත.

(ලකුණු 02)

1.5 පහත සඳහන් දත්ත තොග අයිතමයකට අදාල වේ:

| | | |
|---|---|---|
| උපරිම භාවිතය | : | කිලෝග්‍රෑම් 400 |
| අවම භාවිතය | : | කිලෝග්‍රෑම් 200 |
| පොරොත්තු කාලය (Lead time) | : | මාස 4 - 6 |

ඉහත සඳහන් දත්ත වලට අනුව, යළි ඇණවුම් මට්ටම (re-order level) වන්නේ:

(1) කිලෝග්‍රෑම් 2,400 කි. (2) කිලෝග්‍රෑම් 800 කි.

(3) කිලෝග්‍රෑම් 1,500 කි. (4) කිලෝග්‍රෑම් 1,600 කි. (ලකුණු 02)

*අංක 1.6 සිට 1.8 දක්වා ප්‍රශ්න සඳහා උත්තර, ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.6 වරහන් තුළ දී ඇති පද අතුරෙන්, පහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් සුදුසු පදය/පද තෝරා උත්තර පොතේ ලියන්න:

(1) ශ්‍රම පිරිවැටුම (labour turnover) සඳහා එක් හේතුවක් වන්නේ රැකියාව පිළිබඳ ………………… *(තෘප්තිමත් නොවීමයි / තෘප්තිමත් වීමයි).*

(2) …………………. *(ආන්තික පිරිවැයකරණය / ක්‍රියාකාරකම් පදනම් වූ පිරිවැයකරණය [Activity Based Costing (ABC)] මගින් නිෂ්පාදිතය හෝ සේවාව නිෂ්පාදනය කිරීම සඳහා ඉටුකෙරෙන කාර්යයන් කෙරෙහි අවධානය යොමු කෙරේ.*

(3) …………………. *[අසංකලිත (Non-integrated / සංකලිත (Integrated)]* ගිණුම්කරණ පද්ධතිය යනු මූල්‍ය සහ පිරිවැය ගනුදෙනු යන සියල්ලම එකම ලෙජරයක සටහන් කෙරෙන ගිණුම්කරණ ක්‍රමයයි.

(ලකුණු 03)

**1.7** පහත සඳහන් එක් එක් ප්‍රකාශය **සත්‍ය ද, අසත්‍ය ද** යන්න සඳහන් කරන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන්න ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න:

(1) සමාගම්වල ව්‍යවස්ථාපිත වාර්තාකරණ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ප්‍රමිත පිරිවැයකරණ ක්‍රමය බහුල වශයෙන් භාවිත කරනු ලැබේ.

(2) ශුන්‍ය පදනම් අයවැයකරණයේදී (Zero based budgeting) එක් එක් අයවැය ශුන්‍යයෙන් හෝ මුල සිටම (from scratch) පටන් ගැනීම අවශ්‍ය කෙරේ.

(3) නිෂ්පාදන සමාගම් විසින් භාවිත කරනු ලබන නොයෙකුත් පිරිවැයකරණ ක්‍රම සියල්ල "විශේෂිත ඇණවුම් පිරිවැයකරණය" (specific order costing) සහ "අඛණ්ඩ මෙහෙයුම් පිරිවැයකරණය" (continuous operation costing) යනුවෙන් වර්ගීකරණය කළ හැකිය.

(4) ආන්තික පිරිවැයකරණයේදී විචල්‍ය පිරිවැය අයිතම පමණක් සැලකිල්ලට ගනු ලැබේ. (ලකුණු 04)

**1.8** පහත වගුවේ **A තීරුවේ** දක්වා ඇති එක් එක් පද, **B තීරුවේ** දක්වා ඇති සූත්‍ර සමග ගලපා, ඔබගේ උත්තර පොතේ ලියන්න.

| | A තීරුව | | B තීරුව |
|---|---|---|---|
| (1) | ලාභ පරිමා අනුපාතය (දායකත්වයට විකුණුම් අනුපාතය) | (a) | (අපේක්ෂිත ලාභය / ඒකකයක දායකය) |
| (2) | සුරක්ෂිත ආන්තිකය (ඒකක වලින්) | (b) | (අපේක්ෂිත ලාභය / ලාභ පරිමා අනුපාතය) |
| (3) | සුරක්ෂිත ආන්තිකය (වටිනාකම) | (c) | (ඒකකයක දායකය / ඒකකයක විකුණුම් මිල) x 100 |

(ලකුණු 03)

*A කොටසෙහි අවසානය*

## <u>B කොටස</u>

අනිවාර්යය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

### 02 වන ප්‍රශ්නය

**සීමාසහිත BMS සමාගම** දේශීය වෙළෙඳපොල සඳහා කමිස නිෂ්පාදනය කරනු ලබන අතර, එහි ශ්‍රමිකයන්ට සති පදනම මත වේතන ගෙවනු ලබයි. පැයකට ගෙවනු ලබන සාමාන්‍ය වේතන අනුපාතයෙන් 125% ක්, ඉතිරි කරනු ලබන පැය ගණන සඳහා ශ්‍රමිකයන්ට ප්‍රසාද දීමනාවක් ලෙස ගෙවනු ලැබේ.

පහත සඳහන් තොරතුරු සමාගමේ වැටුප් වාර්තා (payroll) පද්ධතියෙන් උපුටාගන්නා ලදී:

| | |
|---|---|
| සාමාන්‍ය වැඩ කරන සතිය | පැය 8 x දින 5 |
| කමිසයක් මසා නිම කිරීම සඳහා වෙන්කළ ප්‍රමිත කාලය | මිනිත්තු 30 |
| සාමාන්‍යවේතන අනුපාතය | පැයකට රු.150/- බැගින් |

සමාගමේ සේවකයන් දෙදෙනෙකු වන **A** සහ **B** විසින් 2016 ජූලි මස පළමු සතිය තුළ, පිළිවෙලින් කමිස 80 ක් සහ 100 ක් මසා නිමකර තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ,**

2016 ජූලි මස පළමු සතිය සඳහා එක් එක් සේවකයාගේ මුළු ඉපැයීම් වෙන වෙනම **ගණනය කරන්න.** (ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සීමාසහිත M සහ M සමාගම** එහි නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා "UT12" ද්‍රව්‍යය භාවිත කරයි.

2016 ජූනි මාසය සඳහා සමාගමේ පොත් වලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදි:

| දිනය | විස්තරය | ප්‍රමාණය (කිලෝග්‍රෑම්) | කිලෝග්‍රෑම් එකක මිල (රු.) |
|---|---|---|---|
| 2016.06.01 | ආරම්භක ශේෂය | 800 | 25 |
| 2016.06.03 | මිලදී ගැනුම් | 650 | 28 |
| 2016.06.08 | නිකුත් කිරීම් | 850 | - |
| 2016.06.25 | මිලදී ගැනුම් | 850 | 24 |
| 2016.06.30 | නිකුත් කිරීම් | 750 | - |

**ඔබ විසින් කළ යුතු දෑ,**

ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු (FIFO) ක්‍රමය භාවිත කරමින් 2016 ජූනි මාසය සඳහා තොග ලෙජරය **පිළියෙල කරන්න**.

(ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**සීමාසහිත බෙත්රයිස් සමාගම** A සහ B නම් වූ නිෂ්පාදිත දෙකක් නිෂ්පාදනය කරයි. 2016 සැප්තැම්බර් 30 න් අවසන් කාර්තුව සඳහා පහත සඳහන් අයවැයගත දත්ත සමාගමේ පොත්වලින් උපුටා ගන්නා ලදි:

| | A (ඒකක වලින්) | B (ඒකක වලින්) |
|---|---|---|
| විකුණුම් | 12,000 | 16,000 |
| 2016.07.01 දිනට තොගය | 1,000 | 1,500 |
| 2016.09.30 දිනට තොගය | 1,400 | 1,700 |

**ඔබ විසින් කළ යුතු දෑ,**

2016 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා A සහ B නිෂ්පාදිත සඳහා නිෂ්පාදන අයවැය **පිළියෙල කරන්න**.

(ලකුණු 05)

## 05 වන ප්‍රශ්නය

ලී බඩු නිෂ්පාදන සමාගමක කාර්යය (job) **අංක 1198** ට අදාලව පහත සඳහන් තොරතුරු දී තිබේ:

| | |
|---|---|
| පරිභෝජනය කළ සෘජු ද්‍රව්‍ය | රු.34,000/- |
| සෘජු ශ්‍රමය: | |
| එකලස් කිරීමේ දෙපාර්තමේන්තුව | ශ්‍රම පැයකට රු.1,500/- බැගින් පැය 12 |
| නිමකිරීමේ දෙපාර්තමේන්තුව | ශ්‍රම පැයකට රු.2,500/- බැගින් පැය 8 |

එක් එක් කාර්යය සඳහා පහත සඳහන් පරිදි පොදුකාර්යය අන්තර්ග්‍රහණය කරනු ලැබේ:

එකලස් කිරීමේ දෙපාර්තමේන්තුව : සෘජු ශ්‍රම පැයකට රු.1,000/- බැගින්

නිමකිරීමේ දෙපාර්තමේන්තුව : සෘජු ශ්‍රම පැයකට රු.1,750/- බැගින්

සමාගමේ කාර්යයන් සඳහා මිල නියම කිරීමේ ප්‍රතිපත්තිය වන්නේ කාර්යයේ මුළු පිරිවැයෙන් 25% ක ආන්තිකයක් තබා ගැනීමයි.

**ඔබ විසින් කළ යුතු දෑ,**

කාර්යය **අංක 1198** සඳහා අයකළ යුතු මිල **ගණනය කරන්න**. (ලකුණු 05)

## 06 වන ප්‍රශ්නය

සමාගමක විකුණුම් ආදායම වැඩි කර ගැනීම සඳහා එම සමාගම දේශීය වෙළෙඳපොලට අලුත් නිෂ්පාදිතයක් හඳුන්වා දීමට අදහස් කරගෙන සිටී. මෙම අලුත් නිෂ්පාදිතයට අදාලව 2016 අගෝස්තු මාසය සඳහා පහත දැක්වෙන අගයන් පුරෝකතනය කර ඇත:

| | රු. (ඒකකයකට) |
|---|---|
| විකුණුම් මිල | 200 |
| සෘජු ද්‍රව්‍ය පිරිවැය | 60 |
| සෘජු ශ්‍රම පිරිවැය | 40 |
| වෙනත් විචල්‍ය පිරිවැය | 20 |

මෙම නව නිෂ්පාදිතය නිෂ්පාදනය කිරීමට අදාල අතිරේක ස්ථාවර පිරිවැය වර්ෂයකට රු.180,000/- ලෙස අයවැයගත කර ඇති අතර 2016 අගෝස්තු මාසයේදී ඒකක 2,750 ක් විකුණනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ,**

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) සමච්ඡේද ලක්ෂ්‍යය, ඒකක වලින් (Break-even point in units). (ලකුණු 03)

(b) සුරක්ෂිත ආන්තිකය, ඒකක වලින් (Margin of safety in units). (ලකුණු 02)

(මුළු ලකුණු 05)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 07 වන ප්‍රශ්නය

පහත සඳහන් තොරතුරු, **X නිෂ්පාදිතය** මිලදී ගැනීමේ සහ විකිණීමේ ව්‍යාපාරයේ යෙදී සිටින **සීමාසහිත මුත් සමාගමට** අදාල වේ.

(1) 2016 ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් මාස සඳහා පුරෝකතනය කර ඇති මිලදී ගැනුම් සහ විකුණුම් පහත සඳහන් පරිදි වේ:

| | **ජූලි** | **අගෝස්තු** | **සැප්තැම්බර්** |
|---|---|---|---|
| මිලදී ගැනුම් (ඒකක වලින්) | 15,000 | 16,000 | 17,000 |
| විකුණුම් (ඒකක වලින්) | 14,000 | 16,000 | 18,000 |

(2) 2016 ජුනි මාසයේදී **X නිෂ්පාදිතයේ** ඒකකයක විකුණුම් මිල රු.35/- බැගින් වූ අතර, 2016 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි එම මිල රු.2/- කින් වැඩිවනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. සියලුම විකුණුම්, මුදල් පදනම මත සිදු කෙරේ.

(3) සියලුම මිලදී ගැනීම් ණය පදනම මත සිදු කරනු ලබන අතර, සැපයුම්කරුවන්ගේ ඉන්වොයිසි පියවීම සඳහා මාසයක ණය කාල සීමාවක් සමාගමට ලබා දී ඇත. **X නිෂ්පාදිතයේ** ගැනුම් මිල ඒකකයකට රු.20/- බැගින් වූ අතර, ජුනි මාසය සඳහා ඒකක 14,000 ක් මිලට ගෙන තිබුණි.

(4) එක් එක් මාසයේ වැටුප් සහ වේතන රු.140,000/- ක් බැගින් වෙතැයි අපේක්ෂා කරනු ලබන අතර, ඒවා ඊළඟ මාසයේදී ගෙවනු ලැබේ.

(5) 2016 ජූලි මාසයේ සිට, එක් එක් මාසය සඳහා පරිපාලන සහ බෙදාහැරීමේ වියදම් (ක්ෂය අයකිරීම්, වැටුප් සහ වේතන හැර) රු.25,000/- බැගින් වෙතැයි ඇස්තමේන්තු කර ඇති අතර ඒවා අදාල මාසයේදීම ගෙවනු ලැබේ.

(6) 2016 අගෝස්තු මාසයේදී රු.250,000/- ක පිරිවැයක් ඇති යන්ත්‍රයක් අත්පත් කර ගැනීමට අපේක්ෂිතයි.

(7) 2016 ජූලි 01 දිනට සමාගමේ රු.148,000/- ක මුදල් ශේෂයක් පැවතුණි.

**ඔබ විසින් කළ යුතු දෑ,**

2016 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා මාසික පදනම මත මුදල් අයවැය **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## 08 වන ප්‍රශ්නය

**සීමාසහිත PFM සමාගමට, X** සහ **Y** නම්වූ නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් ද, ඇසුරුම් සහ නඩත්තු යන සේවා දෙපාර්තමේන්තු දෙකක් ද ඇත.

2016 මැයි මාසය සඳහා පහත සඳහන් තොරතුරු **සීමාසහිත PFM සමාගමට** අදාල වේ:

| | නිෂ්පාදන දෙපාර්තමේන්තු | | සේවා දෙපාර්තමේන්තු | |
|---|---|---|---|---|
| | **X** | **Y** | **ඇසුරුම්** | **නඩත්තු** |
| වක්‍ර ද්‍රව්‍ය (රු.) | 100,000 | 150,000 | 125,000 | 75,000 |
| වක්‍ර වේතන (රු.) | 10,000 | 5,000 | 1,500 | 15,000 |
| යන්ත්‍ර පිරිවැය (රු.) | 1,000,000 | 1,500,000 | - | 500,000 |
| සේවකයන් ගණන | 50 | 30 | 50 | 10 |
| බිම් ප්‍රමාණය (වර්ග අඩි) | 1,000 | 1,500 | 1,000 | 500 |

2016 මැයි මාසය සඳහා වෙනත් පොදුකාර්ය පිරිවැය පහත සඳහන් පරිදි වේ:

| | රු. |
|---|---|
| යන්ත්‍ර ක්ෂය | 600,000 |
| යන්ත්‍ර රක්ෂණය | 150,000 |
| සේවක සුබසාධන පිරිවැය | 56,000 |
| ගොඩනැගිලි කුලිය | 160,000 |

සේවා දෙපාර්තමේන්තු පිරිවැය, නිෂ්පාදන දෙපාර්තමේන්තු වලට පහත සඳහන් පරිදි බෙදා හරිනු ලැබේ:

| සේවා දෙපාර්තමේන්තු | X | Y |
|---|---|---|
| ඇසුරුම් | 50% | 50% |
| නඩත්තු | 55% | 45% |

**ඔබ විසින් කළ යුතු දෑ,**

එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුවට, පොදුකාර්ය විභජනය කර බෙදා හරින ආකාරය දක්වන ප්‍රකාශනයක් **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## 09 වන ප්‍රශ්නය

අත්වැසුම් නිෂ්පාදනය කරන **සීමාසහිත ඩීප් ප්‍රොඩක්ට් සමාගම**, එහි පිරිවැය ගිණුම්, අසංකලිත ගිණුම්කරණ පද්ධතියක් භාවිත කරමින් පවත්වා ගනී. 2016 ජූනි 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා සමාගම, මූල්‍ය ගිණුම් අනුව රු.340,800/- ක ලාභයක් ද, පිරිවැය ගිණුම් අනුව රු.398,200/- ක ලාභයක් ද, වාර්තා කළේය.

2016 ජූනි 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා පහත සඳහන් තොරතුරු සමාගමේ පොත්වලින් උපුටා ගන්නා ලදී:

(1) තොග ඇගයීම:

| | **පිරිවැය ගිණුම් අනුව (රු.)** | **මූල්‍ය ගිණුම් අනුව (රු.)** |
|---|---|---|
| ආරම්භක තොග: | | |
| අමු ද්‍රව්‍ය | 65,900 | 67,200 |
| නොනිමි වැඩ | 48,800 | 50,300 |
| නිමි භාණ්ඩ | 75,300 | 70,800 |
| අවසාන තොග: | | |
| අමු ද්‍රව්‍ය | 85,900 | 75,200 |
| නොනිමි වැඩ | 68,200 | 60,300 |
| නිමි භාණ්ඩ | 85,300 | 89,400 |

(2) කාර්තුව තුළ කාර්මාන්තශාලාවේ භාවිත කළ පැරණි යන්ත්‍රයක් විකුණන ලද අතර, විකිණීමෙන් ලද ලාභය වන රු.27,600/- මූල්‍ය ගිණුම් වල පමණක් සටහන් කරන ලදී.

(3) සමාගම විසින් ATM යන්ත්‍රයක් ක්‍රියාත්මක කිරීම සඳහා කර්මාන්තශාලා පරිශ්‍රයේ කුඩා පෙදෙසක් බැංකුවකට කුලියට දෙන ලද අතර, ඒ වෙනුවෙන් කාර්තුව සඳහා රු.30,000/- ක කුලියක් ලැබුණි. එය මූල්‍ය ගිණුම්වල පමණක් සටහන් කර තිබුණි.

(4) කාර්තුව සඳහා ආදායම් බදු වෙනුවෙන් මූල්‍ය ගිණුම්වල කරන ලද ප්‍රතිපාදනය රු.51,000/- ක් විය.

(5) පිරිවැය ගිණුම් අනුව කාර්තුව සඳහා ක්ෂය රු.175,000/- ක් වූ අතර මූල්‍ය ගිණුම් අනුව එය රු.234,700/- කි.

(6) පිරිවැය ගිණුම් අනුව පොදුකාර්ය රු.58,250/- ක් වන අතර මූල්‍ය ගිණුම් අනුව එය රු.49,750/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ,**

පිරිවැය ගිණුම් සහ මූල්‍ය ගිණුම් අතර ලාභය සැසඳීමේ ප්‍රකාශනයක් **පිළියෙල කරන්න**. (ලකුණු 10)

*C කොටසෙහි අවසානය*

**<u>D කොටස</u>**

අනිවාර්යය ප්‍රශ්නයකි.

(ලකුණු 25)

## **10 වන ප්‍රශ්නය**

(A) නිෂ්පාදන සමාගමක් වන **සීමාසහිත කෙමිකල් පොදු සමාගම,** අනුක්‍රමික පෙරසැරි දෙකක් භාවිත කරමින් **Y නිෂ්පාදිතය** නිෂ්පාදනය කරනු ලබයි.

I වන පෙරසැරිය ආරම්භයේදී සෘජු ද්‍රව්‍යය හඳුන්වාදෙනු ලබන අතර I වන පෙරසැරියේ සම්පූර්ණ කරන ලද නිමැවුම II වන පෙරසැරියට වහාම මාරු කරනු ලැබේ.

පහත සඳහන් දත්ත I වන පෙරසැරියට අදාල වේ:

| | |
|---|---|
| I වන පෙරසැරියට යෙදවූ සෘජු ද්‍රව්‍යය | රු.228,800/- (කිලෝග්‍රෑම් 22,000) |
| අවසාන නොනිමි තොගය | කිලෝග්‍රෑම් 4,000 |
| සෘජු ශ්‍රමය සහ පොදුකාර්ය | රු.186,000/- |
| පෙරසැරියේ අපතය (losses) | අපේක්ෂිත සාමාන්‍ය අපතය යෙදවූ ද්‍රව්‍ය වලින් 10% ක් වන අතර, සුන්බුන් අයිතම කිලෝග්‍රෑමයක් රු.5/- බැගින් විකිණිය හැකිය. |
| II වන පෙරසැරියට මාරු කළ නිමැවුම | කිලෝග්‍රෑම් 16,400 |

අවසාන නොනිමි තොගයේ සම්පූර්ණ වී තිබූ ප්‍රමාණය පහත පරිදි වේ:

සෘජු ද්‍රව්‍යය : 100%

සෘජු ශ්‍රමය සහ පොදුකාර්ය : 70%

**ඔබ විසින් කළ යුතු දෑ,**

I වන පෙරසැරි ගිණුම **පිළියෙල කරන්න**. (ලකුණු 13)

(B) **සීමාසහිත කෙමිකල් පොදු සමාගමට, PPM** නම්වූ තනි නිෂ්පාදිතයක් නිෂ්පාදනය කරනු ලබනු අතර ප්‍රමිත පිරිවැයකරණ ක්‍රමය භාවිතා කරනු ලබයි.

**PPM** නිෂ්පාදිතයේ ප්‍රමිත පිරිවැය පත්‍රය (standard cost card) පහත සඳහන් පරිදි වේ:

| | **රු.** |
|---|---|
| **A** සෘජු ද්‍රව්‍ය (කිලෝග්‍රෑමයක්, රු.100/- බැගින් කිලෝග්‍රෑම් 2) | 200 |
| සෘජු ශ්‍රමය (පැයකට රු.100/- බැගින් පැය 2) | 200 |
| විචල්‍ය පොදුකාර්ය (පැයකට රු.30/- බැගින් පැය 2) | 60 |
| ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය | 90 |
| **ඒකකයක ප්‍රමිත පිරිවැය** | **550** |

සමාගම, **PPM** නිෂ්පාදිතයේ ඒකක 5,000 ක් 2016 මැයි මාසය තුළ නිෂ්පාදනය කරන ලදී. මාසය සඳහා වන සත්‍ය තොරතුරු පහත පරිදි විය:

- කිලෝග්‍රෑම් එකක් රු.105/- බැගින් **A** සෘජු ද්‍රව්‍යයෙන් කිලෝග්‍රෑම් 11,000 ක් මිලදී ගන්නා ලදී. සමාගම **A** සෘජු ද්‍රව්‍යයෙන් තොග කිසිවක් පවත්වාගනු නොලැබේ.
- සෘජු ශ්‍රම පැය 9,500 ක් වැඩ කර ඇති අතර, පැයකට රු.110/- බැගින් ගෙවීම් කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ,**

(a) ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව,පහත සඳහන් විචලනයන් **ගණනය කරන්න:**

(i) සෘජු ද්‍රව්‍ය මිල විචලනය (Direct Material Price Variance). (ලකුණු 02)

(ii) සෘජු ද්‍රව්‍ය භාවිත විචලනය (Direct Material Usage Variance). (ලකුණු 02)

(iii) සෘජු ශ්‍රම අනුපාතික විචලනය (Direct Labour Rate Variance). (ලකුණු 02)

(iv) සෘජු ශ්‍රම කාර්යක්ෂමතා විචලනය (Direct Labour Efficiency Variance). (ලකුණු 02)

(b) ප්‍රමිත පිරිවැයකරණයේ වාසි හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

*D කොටසෙහි අවසානය*

# <u>කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව</u>

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>අවබෝධය<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැළකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>භාවිතය<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>විශ්ලේෂණය<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |